# අනුරාධපුර යුගයේ කාන්තාවට හිමිවී තිබූ සමාජ තත්වය පිළිබඳ අධ්‍යයනයක් (සීගිරි ගී ඇසුරින් කෙරෙන විමර්ශනයකි)

එච් ඒ දිලුම් රත්නමාලා

අනුරාධපුර යුගයට අයත්, විද්‍යමානව පවතින, අල්පතර සාහිත්‍ය කෘති අතර සීගිරි ගීවලට හිමිවනුයේ වැදගත් ස්ථානයකි. මේ ගී ක්‍රි.ව. 8, 9 සහ 10 වැනි සියවස්වල දී සීගිරිය නැරඹීමට ගිය රසකාමීන් අතින් ලියවී ඇත. ලංකාවේ නන් දෙසින් පැමිණි භික්ෂූන් , රජවරුන් , කුමාරවරුන් , ඇපාවරුන්, ලිපිකරුවන්, ලේඛකාධිකාරීන් , ගුරුවරුන් , කවීන්, වෙළෙඳුන් , වෙදුන් , රාජ සේවකයන් , ගම්පතීන් , වෙනත් ප්‍රභූන් , පිරිවෙන් හා විහාරවාසීන් , පිරිවෙන් කරවූවන් සහ උසස් කාන්තාවන් සීගිරි කවීන් අතර සිටින බව මහාචාර්ය සුචරිත ගම්ලත් සම්භාව්‍ය සිංහල කාව්‍යයේ විකාසනය නම් ග්‍රන්ථයෙහි සඳහන් කර ඇත. මෙම පර්යේෂණයේ අරමුණ වන්නේ සීගිරි ගී රචිත, අනුරාධපුර පශ්චාත්කාලීන අවධිය වන විට කාන්තාවට හිමිවී තිබූ සමාජ තත්වය කවරාකාරද යන්න සම්බන්ධයෙන් විමර්ශනයක නියැළීමයි. ස්ත්‍රී සාක්ෂරතාව , කාන්තා සේවා නියුක්තිය , විවාහයේ දී ස්ත්‍රියට හිමිව තිබූ තත්වය මෙන් ම ස්ත්‍රියක , බිරිඳක හා වැන්දඹුවක වශයෙන් ස්ත්‍රිය කේන්ද්‍ර කරගත් සමාජ සම්මත පිළිබඳ සීගිරි ගීවලින් අනාවරණය වන තොරතුරු ආශ්‍රයෙන් පර්යේෂණ ගැටලුවට අදාළ දත්ත ඒකරාශී කරනු ලැබේ. මෙම යුගයේදී ස්ත්‍රී සාක්ෂරතාව ඉහළ මට්ටමක පැවතී බවට සාධක සීගිරි ගී අතර වෙයි. එමෙන් ම කාන්තා සේවා නියුක්තිය පිළිබඳ සැලකීමේ දී රාජ්‍ය සේවයෙහි නියැළුණු ස්ත්‍රීන් පිළිබඳ තොරතුරු අනාවරණය කරගත හැකිය. තවද විවහයේදී ස්ත්‍රියගේ අභිමතයට ගරු කිරීම මෙන් ම බිරිඳට මුල්තැන හිමිවූ බින්න විවාහ ක්‍රමය පිළිබඳ සඳහන්ව තිබීම සහ පරිවාර සේවකයන් තබාගෙන සුඛෝපභෝගී ජීවිත ගතකළ ස්ත්‍රීන් සම්බන්ධයෙන් ලියවුණු ගී ද මේ ගී අතර ශේෂෝපගතව පවතී. එමෙන් ම  මෙකී යුගයේ දී ස්ත්‍රිය සම්බන්ධයෙන් බලපැවැත්වුණු යම් යම් සමාජ සම්මත පැවති බව සීගිරි ගී වැඩිදුරටත් අනාවරණය කරයි. ඒ අනුව ස්ත්‍රියක, බිරිඳක සහ වැන්දඹුවක ලෙස ඇගේ හැසිරීම නිශ්චිත සම්මතයන්ට අනුරූප ව තීරණය වී තිබුණි. මෙම කරුණු සලකාබලන විට තත් යුගය වන විට ස්ත්‍රියට සමාජයෙහි මනා පිළිගැනීමක් , නිදහසක් සහ ස්වාධීනත්වයක් හිමිවී තිබූ බව නිගමනය කළ හැකිය.

ප්‍රමුඛ පද - අනුරාධපුර යුගය , සීගිරි ගී , කාන්තාව , සමාජ තත්වය , ස්ත්‍රිය